ආයුර්වේද වෛද්‍ය සභාව - 2022

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 01** | | |
| (i) | ප්‍රමිතයේ 21(ඉ) ඡේදය ප්‍රකාරව අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසදනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැය ගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස හෝ ඉදිරිපත් කළ යුතු නමුත් අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී අදාළ ගැලපීම් කරන බව හා මූල්‍ය ප්‍රකාශන වඩාත් නිවැරදි ලෙස ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | ප්‍රමිතයේ 28 ඡේදය ප්‍රකාරව සටහන්වළ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම යටතේ අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනයක් පැහැදිලිව නොසඟවා ඉදිරිපත් කළයුතු වුවත් අදාළ අනුකූලතා ප්‍රකාශනය පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී අදාළ ගැලපීම් කරන බව හා මූල්‍ය ප්‍රකාශන වඩාත් නිවැරදි ලෙස ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | ප්‍රමිතයේ 132(අ) හා 133 ඡේද ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදි භාවිතා කළ මිනුම්කරණ පදනම් සහ 132(ඇ) ඡේදය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීමට අදාල වන අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළු භාවිතා කළ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් 129(ආ) ඡේදය ප්‍රකාරව සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී අදාළ ගැලපීම් කරන බව හා මූල්‍ය ප්‍රකාශන වඩාත් නිවැරදි ලෙස ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | ප්‍රමිතයේ 150 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළයුතු අස්ථිත්වයේ නිත්‍ය පිහිටීම, නෛතික ස්වභාවය, මෙහෙයුම් ස්වභාවය, ප්‍රධාන කටයුතුවල විස්තරයක් සහ මෙහෙයුම් පාලනය කිරීමට අදාල වන ව්‍යවස්ථා පිළිබඳ යොමු යනාදි තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී අදාළ ගැලැපීම් කරන බව හා මුල්‍ය ප්‍රකාශන වඩාත් නිවැරදි ලෙස ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 07** | | |
| | ප්‍රමිතයේ 50 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක මෙහෙයුම්වල එකම ස්වභාවයේ හා එකම භාවිතයෙන් යුත් වත්කම් කාණ්ඩ ලෙස එනම් පන්තියක් ලෙස හඳුනා ගෙන දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතු වුවත්, පිරිවැය රු. 6,979,238 ක්වූ දේපල පිරියත උපකරණ, එලෙස පන්ති වශයෙන් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | විදුලියෙන් ක්‍රියාකරන හා විදුලියෙන් ක්‍රියා නොකරන කාර්යාල උපකරණ වෙන වෙනම දක්වා ඇති බව හා 2023 වර්ෂයේ දී වඩාත් පැහැදිලි ලෙස වර්ගීකරණය කර ඉදිරිපත් කරන බව. | වත්කම් පන්ති වෙන්කර හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවා අපේක්ෂකයන් විසින් සභාවේ බැංකු ගිණුමට ඍජුවම තැන්පත් කර තිබුණු රු. 23,300 ක් ආදායම් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කරන බව. | වර්ෂයට අදාළ සියලු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නව දුරකථන සම්බන්ධතාවයක් ලබා ගැනීමට දැරූ රු.17,015 ක ප්‍රාග්ධන වියදමක් සමාලෝචිත වර්ෂයේ අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කිරීමත්, ඉදිරි වර්ෂයට අදාළ රු.11,100 ක අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ගාස්තුවක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අයභාර වියදම රු. 28,115 ක් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලුහුකම් ක්‍රියාවලි හා වර්ගීකරණයන් මගින් වර්ෂයට අදාළ වියදම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ නිලධාරීන් 10 දෙනෙකු සඳහා වෙන් කළ යුතු පාරිතෝෂික දීමනා රු.293,715 ක් වුවත් එය රු.274,510 ක් ලෙස රු.19,205 ක් අඩුවෙන් ගිණුම්ගත | 2013 ජනවාරි 01 දින සේවයට බඳවාගෙන ඇති නිලධාරිනියකට අදාල පාරිතෝෂිකය ගණනය කිරීමේ දී මෙම අත්වැරදීම | පාරිතෝෂික වෙන්කිරීම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. | සිදුව ඇති බව හා එය 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |
| (ඇ) | තොග සමීක්ෂණ මණ්ඩලයක් මගින් සත්‍යාපනය නොකළ රු.775,774 ක තැපැල් මුද්දර, ලිපිද්‍රව්‍ය හා වෛද්‍ය සහතික පොත් තොගයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් ප්‍රතිපත්තිය මත තොග සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව හා 2023 වර්ෂයේ ගිණුම් වලින් අදාළ හෙළිදරව් කිරීම් සිදු කරන බව. | සමීක්ෂණ මණ්ඩලයක් මගින් සත්‍යාපනය කළ අවසන් තොග ගිණුම්ගත කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටස | | | |
| (i) 11(1)(ඉ) වගන්තිය. | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටසේ (11)(i)(ඉ) වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයන් 03 සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සාමාජිකයන් තිදෙනා පත්කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි . | 1963 මාර්තු 15 දිනැති 13564 අංක දරන ගැසට් පත්‍රය අනුව ඡන්ද විමසීමක් පැවැත්වීමට යන අධික වියදම හා ක්‍රමවේදය කාලානුරූප නොවීම මත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අදාළ කොටස් සංශෝධනය කර ගැනීමට 2022 ජුනි 07 දින වෛද්‍ය සභාව විසින් තීරණය කරන ලද බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. මෙය වසර ගණනාවක සිට පෙන්වා දී ඇති අඩුපාඩුවක් වන බැවින් ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |
| (ii) 18(ඇ) හා (ඇ) වගන්ති | 2022 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු මුළු හෙද නිලධාරීන් සංඛ්‍යාව 39 ක් හා හෙසජ්ජකවරුන් සංඛ්‍යාව 260 ක් වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීනවී නොතිබුණි. ආයුර්වේද | බටහිර හෙද පුහුණුව ලැබූ හෙද නිලධාරීන් ආයුර්වේද රෝහල් සඳහාද යොමු කර ඇති බව හා ඔවුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම නිසා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි නොවන බව. ආයුර්වේද රෝහල් සේවයට පැමිණෙන බටහිර හෙද | ආයුර්වේද පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. මෙය වසර ගණනාවක සිට පෙන්වා දී ඇති අඩුපාඩුවක් වන |

| | | | |
|---|---|---|---|
| | වෛද්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂ වූ හෙද නිලධාරීන් බඳවා ගෙන පුහුණු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු පාසල් මගින් බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරීන් 39 ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා යොදවා ගෙන තිබුණු බැවින් පනතේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව පැවැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | නිලධාරීන් සඳහා මාස තුනක පූර්ණ කාලීන පුහුණුවක් ආරම්භ කර ඇති බව හා භෛසජ්ජකවරුන්ගේ තොරතුරු යාවත් කාලීන කිරීමටත් ලියාපදිංචි නොවූ භෛසජ්ජකවරුන් පිළිබඳ තොරතුරු රැස්කිරීමටත් පළාත් කොමසාරිස්වරුන් හා මධ්‍යම ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත ලිපියක් යොමු කර ඇති බව. | බැවින් ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |
| (iii) 19(1)(අ) වගන්තිය | සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරීවරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින් ලේඛකාධිකාරිවරයකු පත්කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවාගැනීම් සිදුකර තිබුණු බැවින් සභාවේ පරිපාලන කටයුතු විධිමත්ව සිදු කිරීමට බාධාකාරී තත්ත්වයක් උද්ගතව පැවැති බව නිරීක්ෂණය විය. | ලේඛකාධිකාරී තනතුරට බඳවාගැනීමේ පරිපාටිය සකස් කිරීමට අදාළ රීතිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර අවසාන වාර්තා ලැබුණු පසු ගැසට් පත්‍රයේ පල කරන බව හා ඒ අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී බඳවා ගැනීමේ පටිපාටිය සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන බව. | මෙම ක්‍රියාවලිය ඉකුත් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන නමුත් මෙතෙක් ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොමැත. ආයුර්වේද පනතට අනුව කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) (i) | 2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (5) | අදාල මුදල් වර්ෂයයේ දෙසැම්බර් 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම හා ඉදිරි මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 31 ට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2023 මාර්තු 22 පැවති අතර අදාළ වාර්තාව ලබා ගෙන මුදල් රෙගුලාසි 756(5) අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දේශීය ආදායම් කොමසාරිස්ගේ අංක (GIR/2019/03-01 (Ins Q (iv) හා 2019 ජුලි 09 දිනැති චක්‍රලේඛයේ 2 ඡේදය | එකතු කල අගය මත බද්ද (වැට්) ගෙවීමට පෙර සැපයුම්කරුගේ වැට් අංකය ක්‍රියාකාරී මට්ටමේ තිබේද යන්නත් ලියාපදිංචි වූ තැනැත්තා සක්‍රීය වූ බදුකරුවකු ද යන්නත් සනාථ කර ගැනීමට කටයුතු කල යුතු වුවත් එවැනි සනාථ කර ගැනීමකින් තොරව අවස්ථා 12කදී එකතුව රු.45,561 ක් වූ වැට්බදු සැපයුම්කරුවන් 08 දෙනෙකු වෙත ගෙවා තිබුණි. | 2023 වර්ෂයේ සිට අදාල සැපයුම්කරුගේ වැට් අංකය ක්‍රියාකාරීව මට්ටමක පවතීද යන්න සනාථ කර ගනිමින් කටයුතු කරන බව. | දේශීය ආදායම් කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති | සෑම අවුරුදු 05 කට වරක් සෑම ආයුර්වේද වෛද්‍ය වෘත්තියෙකු විසින්ම තම ලියාපදිංචිය අලුත් කළ යුතු නමුත් ඒ සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිය වර්ෂ 05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 18,516 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි. තවද, ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සිය ලියාපදිංචිය අළුත් කළ යුතු වෛද්‍යවරුන් 430 දෙනෙකුට අදාළ අළුත් | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් සෑම වසර 05 වරක් යාවත් කාලීන කිරීම සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍යයෙන් හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මගින් දැනුවත්කර ඇති බව. ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කොට පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මගින් ලියාපදිංචිය අළුත් කිරීමට යොමු කිරීමේ වැඩ | ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලියාපදිංචි වීම හා ලියාපදිංචිය අලුත් කිරීම දිරිගැන්වීමට සහ අදාළ ආදායම් එකතුකර ගැනීමට සුදුසු ක්‍රමවේද ස්ථාපිත කර අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමේ ගාස්තු ප්‍රමාණය රු.795,600 ක් වන බවට සභාව විසින් ගණනය කර තිබුණු නමුත් එම ආදායමද එකතුකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කර නොතිබුණි. | පිළිවෙලක් ආරම්භ කර ඇති බව හා මේ සඳහා ජංගම කාර්යාල පවත්වන බව. | |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයෙන් ප්‍රකාශිත “රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ ” අංක 4.2 ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ කාර්තු 04 සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවද එක් කාර්තුවක රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,295,163 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.104,858 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,190,305 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන හැර මෙහෙයුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 7,187,927 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සභාවේ වැටුප් හා වේතන සඳහා වූ රජයේ ප්‍රදාන හැර, ඉකුත් වර්ෂයේ රු.5,478,047 ක් වූ සභාවේ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.12,704,691 ක් දක්වා රු.7,226,644 කින් හෙවත් සියයට 132 කින් වර්ධනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු.12,728,649 ක් වූ සභාවේ මුළු වියදම, සමාලෝචිත වර්ෂයේදී රු.16,609,528 ක් දක්වා රු.3,880,879 කින් හෙවත් සියයට 30 කින් ඉහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ මෙහෙයුම් වියදම සියයට 46 කින් ඉහළ යාම ඊට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර සම්බන්ධයෙන්ද, ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන්ද ඉකුත් වර්ෂ 5 ක ලැබී තිබුණු පැමිණිලි 247 කින් පැමිණිලි 41 ක විමර්ශන කටයුතු 2023 මාර්තු 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදු කිරීම හා කාලීනව එහි ප්‍රගතිය අගය කිරීම සිදු කළ හැකි පරිදි පැමිණිලි සටහන් කිරීමේ ලේඛණයක් 2022 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන බව. | පොලිසිය වෙත යොමුකර තිබුණු පැමිණිලිද ඇතුළුව සියලු පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු අතර පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදුකිරීම හා කාලීනව එහි ප්‍රගතිය අගය කිරීම සිදුකළ හැකි වන පරිදි අංගසම්පූර්ණ තොරතුරු පවත්වා ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 26,650 ක් බවත්, මියගිය සංඛ්‍යාව 3,827 ක් බවත් වර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මියගිය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාළ ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩ කඩ පවතින බව නිරීක්ෂණය විය. | මරණ සහතිකය හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සනාථකර ඇති ලියවිල්ලක් හෝ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් සිදු කරනු ලබන දැනුම්දීමක් පදනම් කරගෙන ලියාපදිංචි නාම ලේඛනයෙන් නම කපා ඉවත් කිරීම සිදු කරන බව හා එම අවලංගු කළ නම් පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් වෙත දැනුම් දීමටත් එම නාම ලේඛනය ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවියේ පල කිරීමටත් කටයුතු කරන බව. | සුදුසු හා නිවැරදි තීරණ ගැනීම සඳහා යාවත්කාලීන හා නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතු අතර මියගිය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩකඩ වහාම වැලැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් පුහුණු කාලය තුළ ඇගයීම සඳහා සකස් කළ නිර්ණායක අනුව සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් සඳහා පූර්ව ලියාපදිංචියට අදාළ පුවත්පත් දැන්වීම පල කරන ලද අතර ඒ අනුව අයැදුම්පත් ලැබෙමින් පවතින බව හා මෙම ක්‍රමවේදය 2025 සිට ක්‍රියාත්මක කිරීමට වෛද්‍ය සභාව අනුමත කර ඇති බව. | සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබුණු ක්‍රියාකාරකම් 08 කින් ක්‍රියාකාරකම් 02 ක් එනම් සියයට 25ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබුණු ක්‍රියාකාරකමක් වන සෑම වසර 05 වරක් ලියාපදිංචිය අලුත් කළ යුතු වෛද්‍යවරුන්ට අදාල ආකෘති පත්‍ර යොමු කිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 30 ක් තරම් අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | මෙම කාලසීමාව තුළ පැවති ලිපිද්‍රව්‍ය හිඟය, ඉන්ධන හිඟය චක්‍රීය පදනමින් කාර්ය මණ්ඩල සේවයට කැඳවීම යනාදිය හේතුවෙන් වෛද්‍ය සභාව හා අදාළ සේවා ලාභීන් අතර සමීප සබඳතාවය බිඳ වැටීමත්, ජනතාව එක්රැස් කිරීමේ අපහසුතාවයත් මත ඇතැම් ක්‍රියාකාරකම් සියයට 25 කටත් වඩා අඩුවෙන් ක්‍රියාත්මක කිරීමට සිදුවූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා භෛසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | කාර්ය සාධක දර්ශක පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැළසුම් කිරීම පිළිබඳ ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය යොමු කළ අතර ඒ අනුව 2022 වර්ෂයේ සිට පාරම්පරික වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් බාරගැනීම මාර්තු 01 සිට ජුනි 30 දක්වාත්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වාත් පැවැත්වීමටත් ලිඛිත පරීක්ෂණ පෙබරවාරි හා අගෝස්තු මාසවලදී පැවැත්වීමටත් සැළසුම්කර එය ක්‍රියාකාරී සැළැස්මටද ඇතුළත් කර ඇති බව. | සැලසුම් කළ ක්‍රියාවලින්හි කාර්යයන් ඇගයීමට කාර්යසාධන දර්ශක පිහිටුවා සමාලෝචනය කළ යුතුය. |

**4.2** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 8 ක පුනරාවර්තන වියදම් සඳහා වූ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය ඉක්මවා තත්‍ය වියදම් දරා තිබුණු අතර එය සියයට 112 සිට සියයට 140 දක්වා වූ පරාසයක විහිදී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | රට තුළ පැවති ආර්ථික තත්ත්වය මත භාණ්ඩ මිල ඉහල යාම හේතුවෙන් ඇස්තමේන්තු මුදල ඉක්මවා වියදම් දරමින් සභාවේ එදෙනෙදා රාජකාරී කටයුතු සිදු කිරීමට සිදුවී ඇති අතර 2023 වර්ෂයේ දී අදාළ ඇස්තමේන්තු සීමාවන් තුළ කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.3** **තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව යටතට ගැනෙන කරුණු සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සහා සාමාජිකයින් දැනුවත් කොට ඇති බව හා ක්‍රියාත්මක විය යුතු වැඩ සටහන් සකස් කිරීම සඳහා කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |